# ශ්‍රී ලංකාවේ ක්ෂීරපායින්

ආචාර්ය දේවක වීරකෝන්
සත්ත්ව විද්‍යා අංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 3

සම්පත් ද අල්විස් ගුණතිලක
ලෝක සංරක්ෂණ සංගමය
හෝර්ටන් පෙදෙස
කොළඹ 7

## හැඳින්වීම

ක්ෂීරපායින් යනු ඔවුන්ටම ආවේණික වූ ලක්ෂණ ගණනාවක් දරන අචලතාපී පෘෂ්ඨවංශී කාණ්ඩයකි. ක්ෂීරපායි යන වචනයේ අර්ථය වන්නේ පැටවුන් කිරි වලින් පෝෂණය කරන ජීවීන් යන්න යි. මේ සඳහා සියලුම ක්ෂීරපායින් උදරියව පිහිටි ස්ථාන ග්‍රන්ථි දරයි. දේහය රෝමවලින් වැසී තිබීම තවත් සුවිශේෂ ක්ෂීරපායි ලක්ෂණයකි. රෝම, දේහ තාපය යාමනය කර ගැනීම සඳහා ක්ෂීරපායින් දක්වන අනුවර්තනයකි. නමුත් සමහර ක්ෂීරපායින්ගේ රෝම ද්විතියිකව අවශේෂව ගොස් ඇත. මෙය පිහිනීමේදී ඇතිවන ප්‍රතිරෝධය අවම කර ගැනීම සඳහා ජලජ ක්ෂීරපායින් දක්වන අනුවර්තනයකි. තවද ක්ෂීරපායින් හෝ සමෙහි ප්‍රධාන ග්‍රන්ථි දෙවර්ගයක් දැකගත හැක. එනම් ශ්වේතය ග්‍රන්ථි සහ ස්නේහශ්‍රාවී ග්‍රන්ථි වේ. ශ්වේත ග්‍රන්ථි මගින් ශ්‍රාවය කරනු ලබන ශ්වේත දේහ තාපය යාමනය කර ගැනීමට ද, ස්නේහශ්‍රාවී ග්‍රන්ථි වල ශ්‍රාවයන් රෝම ස්නේහනය කර ආරක්ෂා කර ගැනීමට ද ඉවහල් වේ. ක්ෂීරපායින්ගේ හනුව තනි අස්ථියකින් (දන්තාස්ථිය) සමන්විත වේ. ඔවුන් විශමදන්තී ජීවීන් වන අතර කෘන්තක, රදනක, පුරශ්චාර්වක සහ චාර්වක වශයෙන් දත් වර්ග හතරක් දරයි. නමුත් සමහර ක්ෂීරපායින්ගේ දැකගත හැක්කේ මින් එක් වර්ගයක් හෝ වර්ග කිහිපයක් පමණක් වන අතර (උදා: අලියා දරන්නේ චාර්වක දත් පමණක් වන අතර ඇතුන් ගේ දළ වශයෙන් පිහිටා ඇත්තේ විශාලනය වූ කෘන්තක දත් දෙකකි.) සමහරුන්ගේ දත් සියල්ලම ක්ෂීණ වී ගොස් ඇත. (උදා: කබල්ලෑවා) තවද ක්ෂීරපායින්ගේ ජීවිතයේ මුල් අවධියේ කිරි දත් සහ පසුකාලීනව ස්ථිර දත් වශයෙන් දත් පෙළවල් දෙකක් පමණක් දරයි (ද්විවාර දන්තීය). භෞමික ක්ෂීරපායින් ගාත්‍රා යුගල දෙකක් දරණ අතර ඇඟිලි තුඩුවල නිය, නබර හෝ කුර දරයි. මොවුන්ගේ දේහ කුහරය පේශිමය ප්‍රාචීරය මගින් උරස් සහ උදර කුහර වලට වෙන්වී පවතී. මොවුන්ගේ සංසරණ පද්ධතියෙහි දැකගත හැක්කේ වම් සංස්ථානික චක්‍රය පමණි. මොවුන් ග්‍රෛවී කශේරුකා හතක් (7) පමණක් දරණ අතර කශේරුකා දේහය නිරාවතල තත්ත්වය පෙන්නුම් කරයි.

ක්ෂීරපායින් මුලින්ම පරිණාමය වූයේ මීට වසර මිලියන 220 කට පමණ පෙර විසූ උරග පූර්වජයෙකුගෙන් බව විශ්වාස කෙරේ. වර්තමාන පෘථිවිය මත ක්ෂීරපායි විශේෂ 4500 ක් පමණ වෙසෙන බව අනුමාන කෙරේ. මේ සියලුම ක්ෂීරපායින් අයත් වන්නේ මැමේලියා (Mammalia) වර්ගයටය. මෙම වර්ගය තවදුරටත් මොනොට්‍රිමාටා (Monotremata) මාසුපියාලිය (Marsupialia) සහ ඉයුතෙරියා (Eutheria) වශයෙන් උප වර්ග තුනකට බෙදා දැක්විය හැකිය. ශ්‍රී ලංකාවේ දැකගත හැක්කේ මින් ඉයුතෙරියා උප වර්ගයට අයත් ක්ෂීරපායින් පමණි.

## ශ්‍රී ලංකාවේ වෙසෙන ක්ෂීරපායී විශේෂ

වත්මන් ලේඛන වලට අනුව ශ්‍රී ලංකාවේ ක්ෂීරපායි විශේෂ 134 ක් දැකගත හැකිය (වගුව 1). මින් විශේෂ 107 ක් භෞමික පරිසරයෙන් ද ඉතිරි විශේෂ 27 ශ්‍රී ලංකාව අවට වෙරළ කලාපයෙන් ද වාර්තා වේ.



අලියා

වගුව 1: ශ්‍රී ලංකාවේ භෞමික සහ ජලජ ක්ෂීරපායී විශේෂ

| ගෝත්‍රය | කුල ගණන | එකතුව | | ආවේණික | | හඳුන්වාදෙන ලද | |
|---|---|---|---|---|---|---|---|
| | | ගණ | විශේෂ | ගණ | විශේෂ | ගණ | විශේෂ |
| Pholidota | 1 | 1 | 1 | - | - | - | - |
| Insectivora | 1 | 4 | 10 | 1 | 6 | - | - |
| Chiroptera | 7 | 15 | 30 | - | - | - | - |
| Primates | 2 | 4 | 5 | - | 3 | - | - |
| Carnivora | 6 | 9 | 16 | - | 3 | 2 | 2 |
| Proboscidea | 1 | 1 | 1 | - | - | - | - |
| Perrisodactyla | 1 | - | - | - | - | 1 | 2 |
| Artiodactyla | 4 | 6 | 9 | - | 2 | 5 | 6 |
| Rodentia | 4 | 15 | 22 | 1 | 6 | 1 | 1 |
| Lagomorpha | 1 | 1 | 1 | - | - | 1 | 1 |
| **එකතුව** | **28** | **55** | **95** | **2** | **20** | **10** | **12** |
| Cetacea | 5 | 19 | 26 | - | - | - | - |
| Sirenia | 1 | 1 | 1 | - | - | - | - |
| **එකතුව** | **6** | **20** | **27** | - | - | - | - |

ශ්‍රී ලංකාවේ දැකගත හැකි භෞමික ක්ෂීරපායී විශේෂ 107 න් විශේෂ 12 ක් ශ්‍රී ලංකාවට මිනිසා විසින් හඳුන්වා දෙන ලද ක්ෂීරපායීන් වේ. (වගුව 2)

වගුව 2 : ශ්‍රී ලංකාවට හඳුන්වාදෙන ලද ක්ෂීරපායී විශේෂ

| විද්‍යාත්මක නාමය | ඉංග්‍රීසි නාමය | සිංහල නාමය |
|---|---|---|
| *Canis familiaris* | Domestic dog | බල්ලා |
| *Felis catus* | Domestic cat | බළලා |
| *Bos indicus* | Domestic hump backed cattle | බටු හරකා |
| *Bos Taurus* | European cattle | එළ හරකා |
| *Bubalus bubalis* | Domestic water buffalo | මී හරකා |
| *Capra hircus* | Domestic goat | එළුවා |
| *Ovis aries* | Domestic sheep | බැටළුවා |
| *Sus domesticus* | Domestic pig | ගං ඌරා |
| *Equus asinus* | Donkey | බූරුවා |
| *Equus caballus* | Mannar pony | පෝනියා |
| *Rattus norvegicus* | Brown rat | බොර මීයා |
| *Oryctolagus cuniculus* | Domestic rabbit | රට හාවා |

ඉතිරි ක්ෂීරපායී විශේෂ 91, ශ්‍රී ලංකාවට ස්වාභාවිකවම ව්‍යාප්ත වූ විශේෂ ලෙස සලකන අතර මින් විශේෂ 20 ක් ශ්‍රී ලංකාවට ආවේණික වූ ජීවී විශේෂ ලෙස පිලිගැනේ. (වගුව 3)

වගුව 3 : ශ්‍රී ලංකාවට ආවේණික ක්ෂීරපායී විශේෂ

| විද්‍යාත්මක නාමය | ඉංග්‍රීසි නාමය | සිංහල නාමය |
|---|---|---|
| *Macaca sinica* | Sri Lanka toque monkey | ශ්‍රී ලංකා රිලවා |
| *Semnopithecus vetulus* | Purple-faced leaf monkey | ශ්‍රී ලංකා කළු වඳුරා |
| *Loris tardigradus* | Sri Lanka red slender loris | ශ්‍රී ලංකා රත් උනහපුළුවා |
| *Crocidura miya* | Sri Lanka long-tailed shrew | ශ්‍රී ලංකා කුණු හික් මීයා |
| *Crocidura hikmiya* | Sinharaja Shrew | සිංහරාජ හික්මීයා |
| *Suncus montanus* | Highland Shrew | කඳු හික්මීයා |
| *Solisorex pearsoni* | Pearson's long-clawed shrew | ශ්‍රී ලංකා මහ හික් මීයා |
| *Suncus fellowesgordoni* | Sri Lanka pygmy shrew | ශ්‍රී ලංකා පොඩි හික් මීයා |
| *Suncus zeylanicus* | Sri Lanka jungle shrew | ශ්‍රී ලංකා කැලෑ හික් මීයා |
| *Paradoxurus aureus* | Sri Lanka golden wetzone palm civet | ශ්‍රී ලංකා රන් තෙත් කලාපීය කලවැද්දා |
| *Paradoxurus montanus* | Sri Lanka brown palm civet | ශ්‍රී ලංකා දුඹුරු කලවැද්දා |
| *Paradoxurus stenocephalus* | Golden dry zone palm civet | රන් වියලි කලාපීය කලවැද්දා |
| *Moschiola meminna* | Sri Lanka mouse deer | ශ්‍රී ලංකා මීමින්නා |
| *Moschiola kathygre* | Sri Lanka pygmy mouse deer | ශ්‍රී ලංකා කුරු මීමින්නා |
| *Funambulus layardi* | Sri Lanka flame striped jungle squirrel | ශ්‍රී ලංකා මුකලන් ලේනා |
| *Mus fernandoni* | Sri Lanka spiny mouse | ශ්‍රී ලංකා කටු හික් මීයා |
| *Mus mayori* | Sri Lanka spiny rat | ශ්‍රී ලංකා කටු හික් මීයා |
| *Srilnkamys ohiensis* | Sri Lanka bi-colored rat | ශ්‍රී ලංකා දෙපැහැ මීයා |
| *Rattus montanus* | Nillu rat | ශ්‍රී ලංකා නෙලු මීයා |
| *Vandeleuria nolthenii* | Sri Lanka long tailed tree mouse | ශ්‍රී ලංකා ගස් මීයා |

ශ්‍රී ලංකාවෙන් වාර්තාවන භෞමික ක්ෂීරපායී විශේෂ 95 න් 40 ක් තර්ජනයට ලක්වූ ජීවී විශේෂ ලෙස IUCN අන්තර් ජාතික සංරක්ෂණ සංගමය විසින් වර්ෂ 2007 දී පළ කළ රතු ලැයිස්තුවෙහි සඳහන් වේ.

මීට අමතරව පොසිල සාධක සලකා බලන කල ශ්‍රී ලංකාවේ වැඳවී ගිය ක්ෂීරපායී විශේෂ 21 ක් වාර්තා වේ. ශ්‍රී ලංකාව තුල දැනට හමුවී ඇති පොසිල නිධි ප්‍රධාන කාල පරිච්ඡේද තුනකට අයත් වේ. එනම් ජුරාසික යුගය මයොසීන යුගය සහ ප්ලයිස්ටොසීන යුගයට අයත් පොසිල වේ. මින් ක්ෂීරපායී පොසිල හමුවන්නේ මයෝසීන සහ ප්ලයිටෝසීන නිධි වලින් පමණි.

මයෝසීන යුගය මීට වසර මිලියන 26 සිට 7 දක්වා කාල වකවානුව තුල ව්‍යාප්ත වී තිබූ අතර මෙම වකවානුවේ දී මුහුදු මට්ටම ඉහල යාම හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ වයඹ සහ ගිනිකොණ දිග වෙරළබඩ ප්‍රදේශ බොහොමයක් මුහුදු ජලයෙන් යට වී තිබුණු බව පොසිල සාධක වලින් නිරාවරණය වී ඇත. මයොසීන යුගයට අයත් පොසිල නිධි පුත්තලම සිට යාපනය දක්වා ප්‍රදේශයෙන් ද යාල වනෝද්‍යානයෙහි පිහිටි මිනිහා ගල්කන්ද ප්‍රදේශයෙන් ද හමුවේ. මෙම පොසිල නිධි අතර තිබී නෂ්ටප්‍රාප්ත වූ මුහුදු ඌරන් විශේෂයක් සහ මුල්ලන් විශේෂ තුනක් (වගුව 4) හඳුනාගෙන ඇත. (Goonatilake, 2001)

වගුව 4 : ශ්‍රී ලංකාවේ නෂ්ටප්‍රාප්ත වූ ක්ෂීරපායී විශේෂ

| කාල පරිච්ඡේදය | ගෝත්‍රය | විද්‍යාත්මක නාමය | ඉංග්‍රීසි නාමය | සිංහල නාමය |
|---|---|---|---|---|
| මයොසීන | **Sirenia** | *Miodugong brevicranius* | Dugong | මුහුදු ඌරා |
| | **Cetacea** | *Mioturdiops mulla* | Dolphin | මුල්ලා |
| | | *Mioceta bigelowi* | Dolphin | මුල්ලා |
| | | *Mioceta magna* | Dolphin | මුල්ලා |
| ප්ලයිස්ටොසීන | **Rodentia** | *Tatera sinhaleya* | Rat | වැලි මීයා |
| | | *Hystrix sivalensis sinhaleyus* | Procuppine | ඉත්තෑවා |
| | **Artiodactyla** | *Muva sinhaleya* | Spotted deer | මුවා |
| | | *Sus sinhaleyus* | Wild boar | වල් ඌරා |
| | | *Gona sinhaleya* | Sambur | ගෝනා |
| | | *Bos zeylonicus* | Cattle | හරකා |
| | | *Bibos gaurus sinhaleyus* | Gaur | ගවරා |
| | | *Hexaprotodon palaeindicus sinhaleyus* | Hippopotamus | හිපොපොටෙමස් |
| | **Perisodactyla** | *Rhinocerus sinhaleyus* | Rhinoceros | රයිනොසිරස් |
| | | *Rhinocerus kagavena* | Rhinoceros | රයිනොසිරස් |
| | **Probosidea** | *Hypselephas hysudricus sinhaleyus* | Elephant | අලියා |
| | | *Palaeoloxodon namandicus sinhaleyus* | Elephant | අලියා |
| | | *Elephas maximus sinhaleyus* | Elephant | අලියා |
| | **Carnivora** | *Panthera leo sinhaleyus* | Lion | සිංහයා |
| | | *Panthera tigris* | Tiger | ව්‍යාඝ්‍රයා |
| | | *Cuon javanicus sinhaleyus* | Wild dog | වල් බල්ලා |
| | **Primates** | *Homopithecus sinhaleyus* | Man | මානවයා |
| | | *Homo sinhaleyus* | Man | මානවයා |

මීට වසර මිලියන 3 සිට වසර 10,000 අතර කාල වකවානුව ප්ලයිස්ටොසීන යුගය ලෙස හඳුන්වා දෙන අතර මෙම යුගයට අයත් පොසිල සබරගමුව සහ ඌව ප්‍රදේශ වලින් සොයා ගෙන ඇත. මෙම යුගයෙන් වාර්තාවන සියලු විශේෂ භෞමික ජීවීන් වන අතර මෙයට අලි ඇතුන් විශේෂ 2 ක්, රයිනෝසිරස් විශේෂයක්, හිපපොටේමස් විශේෂයක්, ව්‍යාඝ්‍ර විශේෂයක්, සිංහ විශේෂයක් සහ සුනඛ විශේෂයක් ඇතුළුව නෂ්ටප්‍රාප්ත වූ ක්ෂීරපායීන් විශේෂ 17 ක්ද වර්තමානයේ ශ්‍රී ලංකාවේ වෙසෙන ආසියානු අලියාගේ උප විශේෂයක් ද (වගුව 4) අයත් වේ. (Deraniyagala, 1958). මීට අමතරව

ප්ලයිටොසීන යුගයේ සිට ශ්‍රී ලංකාවේ තෙත් කලාපය ආශ්‍රිතව වාසය කළ ගවරා 16 වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ වාසය කල බව රොබට් නොක්ස්ගේ වාර්තා වලින් තහවුරු වේ. එයට නිදසුනක් ලෙස වර්තමානයේද ශ්‍රී ලංකාවේ සමහර ස්ථාන නාම සහ ශාඛ නාම "ගවර" පදය සමග ඈඳී තිබීම දැක්විය හැකිය.
උදා :- ගවරගල, ගවරවිල, ගවරමාන

## ශ්‍රී ලංකාවේ ක්ෂීරපායීන්ගේ ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ වෙසෙන භෞමික ක්ෂිරපායී විශේෂ 95 න් විශේෂ 20 ක් ශ්‍රී ලංකාවට ආවේණික වන අතර ඉතිරි විශේෂ 75 ශ්‍රී ලංකාවට දේශීය වූ විශේෂ ලෙස සැලකේ. මින් විශේෂ 5 ක් දකුණු ආසියාව පුරාම ප්‍රචලිත වී ඇති අතර විශේෂ 70 ක් ඉන්දියානු උප මහද්වීපයට සීමා වී ඇත. මෙම විශේෂ 70 න් විශේෂ 23 ක් දැකගත හැක්කේ ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ පමණි.ඉතිරි විශේෂ 43 සළකා බලන කල ඉන්දියාව සහ ශ්‍රී ලංකාව හැරුණු කොට විශේෂ 12 ක් පාකිස්ථානයේ පමණක් ද, විශේෂ 7 ක් නේපාලයේ පමණක් ද, විශේෂ 4 ක් බංගලා දේශයේ පමණක් ද දැකගත හැක.



කබල්ලෑවා

ශ්‍රී ලංකාව තුල ක්ෂීරපායී විශේෂ වල ව්‍යාප්තිය සලකා බැලූ කල විශේෂ 22 ක් ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්ත වී ඇති අතර විශේෂ 13 ක් කඳුකර සහ අතර මැදි කලාපය හැර අනෙක් සියළුම ප්‍රදේශවල දැකිය හැක. විශේෂ 6 ක් තෙත් කලාපයට පමණක් සීමා වී ඇති අතර විශේෂ 6 ක් කඳුකර කලාපයට පමණක් සීමා වී ඇත. ශ්‍රී ලංකාවට ආවේණික වූ විශේෂ 16 න් 9 ක් ම තෙත් කළාපයට පමණක් සීමා වී තිබීමද තවත් සුවිශේෂ ලක්ෂණය කි. ආවේණික විශේෂ 7 ක් වඩාත් පුළුල් ව්‍යාප්තියක් දක්වයි.

## ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානව සාධක :

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානව සාධක මීට වසර 125,000 පමණ කාලය දක්වා ව්‍යාප්ත වී ඇත. මෙම කාල වකවානුව පුරා ශිලා යුගය, මධ්‍ය ශිලා යුගය සහ නව ශිලා යුගය වශයෙන් යුග තුනකට බෙදා දැක්විය හැක.මින් ශිලා යුගයට අයත් මානව ගල් මෙවලම් බුන්දල හා විල්පත්තු ජාතික වනෝද්‍යාන වලින් වාර්ථා වී ඇත. මධ්‍ය ශිලා යුගයට අයත් පොසිල මීට වසර 37000-60000 ත් අතර කාල පරාසයට අයත් වන අතර මෙම යුගයේ ශ්‍රී ලංකාවේ වාසය කල මානවයා පොදුවේ බලංගොඩ මානවයා නමින් හඳුන්වයි. මොවුන් ශ්‍රී ලංකාව පුරා ගල්ගුහා හා විවෘත බිම් ඇසුරු කොටගෙන දඩයම් ජීවන විලාසයක් ගත කලහ. මොවුන් වාසය කළ ගල් ගුහාවල කළ කැණීම් වලින් ඔවුන් විසින් ආහාරයට ගත් ක්ෂීරපායී විශේෂ ගණනාවක සාධක හමුවේ. මේ අතර ගොනුන්, මුවන්, හරකුන්, කුළු හරකුන්, උගුඩුවන්, ලේනුන්, මීයන්, වැනිසතුන්ගේ අස්ථි හමුවේ. ( Deraniyagala 2004). නව ශිලා යුගයට අයත් සාධක හෝර්ටන්තැන්න ජාතික වනෝද්‍යානයෙන් හමුවන අතර, එම පොසිල විශ්ලේෂණය කිරීමෙන් මේ වන විට හරකුන් ගෘහාර්ශ්‍රිතව ඇතිකල බවට සාධක හඳුනාගෙන ඇත.(Deraniyagala, 2004) එමෙන්ම දිවයින පුරා ගල්ලෙන් වලින් හමුවන ප්‍රාග් ඓතිහාසික චිත්‍ර මෙම ප්‍රාග් ඓතිහාසික මානවයන් විසින් අඳින ලද බවට විශ්වාස කෙරෙන අතර, එම චිත්‍ර අතර ඇත් , සිංහ, ගව, ගෝන, දිවි මෙන්ම හඳුනානොගත් කුඩා ක්ෂීරපායී විශේෂ ගණනාවක රූ සටහන් දැකගත හැකිය. මෙවන් චිත්‍ර හමුවන ලෙන් අතර, ලාහුගල හූලන්නුගේ ලෙන, කෑගල්ලේ දොරනක ලෙන, තන්තිරිමලේ ලෙන් චිත්‍ර, සහ දිඹුලාගල ලෙන් චිත්‍ර, ප්‍රධාන තැනක් ගනී. ඒ කෙසේ වුවත් මෙම ලෙන් චිත්‍ර වැදි ජනයා විසින් අඳින ලද බවටද මතයක් පලවී ඇත. (Nandadeva, 1986)

මීළඟට උදාවන යකඩ යුගයේ සාධක අනුරාධපුර නගරයේ කැණීම් වලින් මතුවී ඇත. මේ වනවිට අශ්වයින් ශ්‍රී ලංකාවට ගෙනෙනු ලැබ ඇති බව මෙම කැණීම් අතර හමුවූ අස්ථි වලින් ස්ථිර වේ. එමෙන්ම වළවේ ගංමෝය ආශ්‍රිත ඉපැරණි ගොඩවාය වරාය ආශ්‍රිතව කල කැනීම් වලින්ද අශ්ව විශේෂයන් වාර්තා වී ඇත. (Deraniyagala, 2004) මහින්දාගමනයත් සමග උදාවන ඓතිහාසික යුගය සනිටුහන් කරන අනුරාධපුර, පොලොන්නරු, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොල, කෝට්ටේ, සීතාවක, මහනුවර රාජධානි වලට අයත් සංස්කෘතිකාංග අතර ක්ෂීරපායී විශේෂ ගණනාවක මූර්ති කැටයම් දැකිය හැකිය. මින් ප්‍රධාන ස්ථානයක් සඳකඩ පහනට අයත්වන අතර ඇත්, අස්, සිංහ, ගව, යන ක්ෂීරපායී විශේෂ 4 ක් අනුරාධපුර යුගයේ සඳකඩ පහණෙහි දැකිය හැකිය. මින් පසුව එළඹෙන පොළොන්නරු යුගයේ දී හින්දු බලපෑම හේතු කොට ගෙන ගව රූපය සඳකඩ පහණින් ඉවත්කර ඇතිබව පෙනී යයි. (Wijesekeram undated) මීට අමතරව කොරවක්ගල්, දොරටුපාල රූප, වාහල්කඩ ආශ්‍රිතව සිංහ, ඇත්, ගව, මුව, මුගටි, ආදී ක්ෂීරපායින්ගේ කැටයම් දැකගත හැකිය. තවද, පනාපිටිය අම්බලම සහ ඇම්බැක්කේ දේවාලය ආශ්‍රිත ලී කැටයම් ඇත්, සිංහ, මුව, දිවි රූප දැකගත හැකිය. එමෙන්ම ක්ෂීරපායී රූ කාසි සලකුණු කිරීම සඳහාද යොදාගෙන ඇත. අනුරාධපුර යුගයට අයත් කාසිවල ඇත් රුව ද මධ්‍ය අනුරාධපුර යුගයට අයත් කාසිවල සිංහ සහ සිංහ ධේනු රූ ද යොදා ගෙන ඇත. එමෙන්ම අනුරාධපුර,

පොළොන්නරුව, මහනුවර සහ කෝට්ටේ ප්‍රදේශ වලින් හමුවන සෙවිලි උළුවල (පෙති උළු) සිංහ ඇත් ලාංඡන දැකගත හැකිය. (Wisumperuma, 2003)

අතීතයේ සිට මානව ගෝත්‍ර හඳුන්වා ගැනීමට සත්ත්ව විශේෂ ලාංඡන ලෙස භාවිතා කල බවට සාධක එමට ඇත. සිංහල ජාතිය සිංහයාගෙන් ද, චෝළ වංශිකයන් ව්‍යාඝ්‍රයාගෙන් ද, ලම්භකර්ණ වංශිකයන් හාවා ගෙන් ද නිරූපණය විණි. තවද මෙම ලාංඡන ධජ වලටද අන්තර්ගත කෙරිණි. දඹුලු ලෙනෙහි චිත්‍ර අතර දුටුගැමුණු එළාර යුද්ධය පෙන්නුම් කරන රූ සටහනේ දුටු ගැමුණු රජුගේ ධජයේ ඇත්තේ කඩුවක් අතින්ගෙන දිවයන සිංහයකුගේ රුවකි. අද මෙම සිංහ රුව ගාලු දිස්ත්‍රික් කොඩිය සඳහා යොදා ගෙන ඇත. ජාතික කොඩියෙහි සිංහ රුවට අමතරව මහනුවර, කොළඹ, ගාල්ල, අනුරාධපුර, කුරුණෑගල, අම්පාර, හම්බන්තොට දිස්ත්‍රික්ක කොඩි වලට ද සිංහරුව භාවිතා වේ. එමෙන් ම මාතර දිස්ත්‍රික්ක කොඩියට අලි රුවත්, පොළොන්නරු දිස්ත්‍රික් කොඩියට වලසාත්, මොණරාගල දිස්ත්‍රික් කොඩියට දිවියාත්, යොදාගෙන ඇත. මීට අමතරව විවිධ බලප්‍රදේශ, ආයතන සහ නිලතල පිළිඹිබු කෙරෙන කොඩිවල අත්, ඇස්, මුව, සිංහ රූ යොදා ගෙන ඇත. (Silva, 2005)

ශ්‍රී ලංකාවේ ලිඛිත ඉතිහාසය තුලද ක්ෂිරපායින් පිළිබඳ විවිධ සටහන් රාශියක් දැකගත හැකිය. ශ්‍රී ලංකාවේ පැරණිතම ලියවිලි ක්‍රි.පූ. 3 වන සහ 2 වන සියවස්වලට අයත් ලෙන් හා ශිලා ලිපි වේ. මෙම ලිපි බොහොමයක් ලෙන්, විහාර සහ නොයෙකුත් දාන වස්තූන් පූජා කිරීම පිළිබඳව කියැවී ඇති අතර, ඒවා පූජා කල අයවලුන්ගේ නාමයන්ට අමතරව ඔවුන්ගේ නිලතල සඳහන් වේ. මෙම ලිපිවල "අස අදෙක" හෝ "අති අදෙක" (අශ්ව අධ්‍යක්ෂවරු), "අසපිරිය" (අශ්ව පුහුණුකරුවන්), "අති අදෙක" (ඇත් අධ්‍යක්ෂවරුන්), "අති අචරිය" (ඇත් ගොව්වන්) වැනි නිලතල සඳහන් වේ. මෙම ලිපි තෝනිගල, පෙරියකුලම්, හිනාරගම, කදුරුවල, නාවලන්කුලම වැනි ස්ථානවලින් සොයාගෙන ඇති අතර, ක්‍රි.පූ යුගයට අයත් ලිපි ලෙස සැලකේ. මින් පෙනී යන්නේ මෙම යුගය වනවිට සතුන් ගෘහාශ්‍රිත වූවා පමණක් නොව, ක්ෂිරපායින් එදා සමාජයේ බොහෝ වැඩ සඳහා යොදා ගත් බවත් ඒ සඳහා වෙන් වූ ආයතන සහ නිලතල ද එදා ජන සමාජය තුල නිර්මාණය වී තිබුණ බවය. (Paranavithana, 1970)

එමෙන්ම විදේශික වාර්තාවන්ට අනුව ප්ලීනිගේ ලෝක සිතියමේ (Pliny's world map) ශ්‍රී ලංකාවේ පුත්තලමත් මන්නාරමත් අතර පිහිටි ප්‍රදේශය "Hippurus" ලෙස සඳහන්ව ඇත. මෙහි අර්ථය නම් අශ්ව කන්ද යන්නයි. මෙම ස්ථානය වර්තමාන සිතියම්වල "කුදිරමලේ" නමැති ද්‍රවිඩ නාමයෙන් හඳුන්වන අතර එහි අර්ථයද අශ්ව කන්ද යන්නය. මෙය පුරාණයේ "අව ගිරිය" (අශ්ව කන්ද) ලෙස හැඳින්වූ අතර, ඒ අසල "අව නගරය" පිහිටා තිබුණු බවය. තවද 17 වන සියවස වන විට යාපනය ආශ්‍රිත දූපත්වල අශ්වයින් ඇල්ලීම පිළිබඳව රූපසටහන් හා විස්තර ලන්දේසි ජාතික P. Baldaeus ගේ වාර්තාවල සඳහන් වේ. (Baldaeus, 1672)

ශ්‍රී ලංකාවේ ලිඛිත ඉතිහාසය සලකා බලන කල 4 වන සියවසේදී මහානාම හිමියන් විසින් රචිත "මහාවංශයට" ප්‍රමුඛ ස්ථානයක් හිමිවේ. මෙහිදී ක්ෂිරපායි සතුන් පිළිබඳව නොයෙක් අවස්ථාවන්හිදී සඳහන්වේ. ලංකා ඉතිහාසයෙහි ආරම්භය ගැන සඳහන් කරන මහාවංශ කතුවරයා විජය රජු ඇතුළු පිරිස කුවේණිය සොයා යෑමේදී බැල්ලියකගේ අඩි සලකුණු ඔස්සේ ගමන් කල බව ලියා දක්වයි. එයින් අදහස් වන්නේ ක්‍රි.පූ. 500 දී ශ්‍රී ලංකාවේ ගෘහාශ්‍රිතව බල්ලන් විසූ බවත් විජය රජු ඇතුළු පිරිසට ක්ෂිරපායී සතුන්ගේ අඩි සළකුණු පිළිබඳව මනා දැනුමක් තිබූ බවත්ය.

අලින් සහ අශ්වයින් යුධ කටයුතු සඳහා යොදාගත් බව මහාවංශයෙහි නොයෙකුත් ස්ථානයන්හි සඳහන්වේ. දුටු ගැමුණු කුමරු සතුව සිටි කණ්ඩුල ඇතා සහ අශ්ව වෙළඹ පිළිබඳව හොඳින් විස්තර කර ඇත. තවද දුටුගැමුණු කුමරුගේ දසමහා යෝධයන් අතර "වේළුසුමන"සෙනෙවි අතිදක්ෂ අශ්ව පුහුණු කරුවෙකු බවද සඳහන් වේ. එසේම විජිතපුර සටනට යෑමට පෙර පණ්ඩුල ඇතුට මීහරක් හම් වලින් සකස්කල සැට්ටයක් පැළඳවූ බවද සඳහන් වේ. (Adithiya 1981) බුද්ධදාස රජු අශ්වයින් සඳහා වෛද්‍යවරුන් පත්කල බවද, iv වන මහින්ද රජු වඳුරන්, මුවන් සහ ඌරන් හට දානය පිරිනැමූ බව ද, පරාක්‍රම බාහු රජු පොළොන්නරුව රජ වනවිට එම ප්‍රදේශය දිවියන් සහ වලසුන්ගෙන් ගහණ වූ ප්‍රදේශයක් බවද සඳහන් වේ. තවද 5 සහ 10 වන සියවස් අතර රචිත "සහස්සවත්ථුප්පකරණය" නම් ග්‍රන්ථයෙහි තුම්බලතිස්ස පබ්බත වෙහෙරේ ගුහා තුල (වර්තමානයේ අම්පාරේ රජගල තැන්න ලෙස හඳුන්වන ප්‍රදේශයේ) 500 ක් කිරි වවුලන් (වග්ගුලියන්) විසූබව සඳහන් වේ. මෙම සටහන ලංකා ඉතිහාසයේ වවුලන් පිළිබඳව දැක්වෙන ස්ථානයක් නිශ්චිතවම සඳහන් වෙන පැරණිම වාර්තාව ලෙස උපුටා දැක්විය හැකිය. (Piyerathena, 1999)

එමෙන්ම ජනප්‍රවාදයේ එන ඇදහිලි, විශ්වාස තුලද ක්ෂිරපායින්ට විශේෂ ස්ථානයක් හිමිවේ. මහසෝනාට වලස් හිසක් තිබුණු බවද, අලි, ඇතුන්, වල්ඌරන්, කුළු හරකුන් සහ වලසුන් ඇල්ලීමට හෝ පැන්නීම සඳහා මන්ත්‍ර ශාස්ත්‍රයක්ද ගොඩනැගී තිබිණ. එමෙන්ම අලි සහ කුළු හරකුන් ඇල්ලීමට අතිදක්ෂ මරික්කාවරුන් මෑතක්වන තුරුම නැගෙනහිර ප්‍රදේශයේ විසූබව පොත පතෙහි සඳහන් වේ.

එමෙන්ම කොහොඹයක් කන්කාරිය ශාන්ති කර්මය පඬුවස්දෙව් රජු සිහිනෙන් දිවියකු දැක බියවීම හේතුකොටගෙන වැළඳුණු දිවිදෝෂයට පිළියමක් ලෙස ආරම්භ කල බවද විශ්වාස කෙරේ. එමෙන්ම, විවිධ දෙවිවරු තමන්ගේ වාහනය ලෙස ක්ෂිරපායී සතුන් (උදා: ඊශ්වර දෙවියන් ගවයා ද, සමන් දෙවියන් සුදු ඇතාද, ගනදෙවියන් මීයා ද, මහසෝනා ඌරාද, කාලි දෙවියන් ව්‍යාඝ්‍රයා ද, සූනියම් දෙවියන් සුදු අශ්වයාද) යොදා ගත් බවට විශ්වාස කෙරේ.

තවද, ජන වහරේ යෙදෙන පද පිරුළු සඳහාද (උදා: උණ හපුලුවාට උගේ පැටියා ලොකුයි, ගොයම මුවෝ කෑවාට ගෙදර මුව හමට තඩිබාන්නා සේ, කැලේ මාරු උනාට දිවියා

පුල්ලි මාරුකරන්නේ නෑ) අලි තල්ගෙඩි කෑමට පැමිණීම නිරීක්ෂණය කළ ගැමියා, ''ඔන්න බබෝ ඇතින්නියා, තල් අරඹේ සිටින්නියා වැනි දරු නැලවිලි ගීතවල මූලාශ්‍රය ලෙස ද ක්‍ෂිරපායී සතුන් යොදා ගත්තේය. එමෙන්ම ජන වහර තුල මෙතෙක් සොයා නොගන්නා ලද ක්‍ෂිරපායී විශේෂ ගණනාවක් (උදා: රහු වලහා, නිට්ටෑවා, හිවල්මුවා, ලෙනම දිවියා, නිල වඳුරා) පිළිබඳව සඳහන් වේ.

### ශ්‍රී ලංකාවේ ක්ෂිරපායින්ට ඇති තර්ජන සහ සංරක්ෂණ අවශ්‍යතා

ශ්‍රී ලංකාවේ ක්ෂිරපායින්ට එල්ලවී ඇති ප්‍රධානතම තර්ජනය ලෙස ඔවුන්ගේ වාසස්ථාන වල ප්‍රමාණාත්මක අඩුවීම සඳහන් කල හැකිය. විශේෂයෙන්ම තෙත් කලාපයේ ඇති ස්වභාවික වාසස්ථාන ඉතා ශීඝ්‍රයෙන් විනාශ වී යන අතර ඉතිරි වී තිබෙන වාසස්ථාන ද කැබලිකරණයට ලක්වී ඇතිබව මෑතක දී කරන ලද සමීක්ෂණ වලින් පෙනී යයි. නමුත් ශ්‍රී ලංකාවේ ක්ෂිරපායින්ගෙන් (විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට ආවේණික විශේෂ) 90% කටත් වඩා තෙත් කලාපයේ වෙසෙන අතර විශේෂ ගණනාවක් තෙත් කලාපයට පමණක් සීමා වී ඇත. එබැවින් තෙත් කලාපයේ සිදුවන මෙම වාසස්ථාන වල පරිහානිය මෙම ජීවීන්ට තදින්ම බලපානු ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ ක්ෂිරපායින් සංරක්‍ෂණය සඳහා තෙත් කලාපයේ ඉතිරිව ඇති ස්වාභාවික වාසස්ථාන වලින් හැකි තරමක් සංරක්ෂණය කිරීමට සහ සංරක්ෂණ හිතකාමී භූමි පරිහරණයට ලක් කිරීම ඉතා වැදගත්ය.



රිලවා

ශ්‍රී ලංකාවේ ක්ෂිරපායින් හට එල්ලවී ඇති තවත් තර්ජනයක් වන්නේ සතුන් දඩයම් කිරීමය. විවිධ හේතූන් නිසා ක්ෂිරපායින් දඩයම් කරනු ලැබේ. ආහාර සඳහා දඩයම් කිරීම (උදා: මුවා, ගෝනා, වල් ඌරා යනාදීන්) සම සඳහා දඩයම් කිරීම (උදා: දිවියා) වගා හානි කිරීම නිසා දඩයම් කිරීම (උදා: අලියා, දඬු ලේනා, වඳුරන්, ඉත්තෑවා) ඉන් ප්‍රධාන හේතු වේ.

ශ්‍රී ලංකාව ක්ෂිරපායින්ගේ විශේෂ ඝනත්වය (වර්ග කිලෝ මීටර් 10,000 ක ඇති විශේෂ ගණන) මත සලකා බලන කල ආසියානු කලාපයේ ඉහලම ස්ථානය ගනී. නමුත් මොවුන්ගේ බොහොමයක් වඳවීමේ තර්ජනයට මුහුණ දී ඇත. එබැවින් මෙම ජීවීන් සංරක්ෂණය කිරීම සඳහා අනාගතයේ දී අපට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවනු ඇත. එය සාර්ථක කරගත හැක්කේ සැලසුම් සහගත සංරක්ෂණ ක්‍රියාවලියක් තුල පමණි. මේ සඳහා අවශ්‍ය පසුබිම් ක්‍රියාවලි ගණනක් මේ වන විට පරිසර අමාත්‍යාංශයේ දායකත්වය යටතේ දියත් කොට ඇත. මෙම ක්‍රියාවලිය තුලින් ක්ෂිරපායින් මෙන්ම ශ්‍රී ලංකාවේ අනෙක් ජෛව විවිධත්වය ද සංරක්ෂණය කිරීම සඳහා අඩිතාලම වැටෙනු ඇතැයි යන්න සංරක්ෂණ හිතකාමී සැමගේ අපේක්ෂාවයි.



උණ හපුළුවා